**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 20/95**

මගේ අංකය: IV-2/9/361/15(එච්)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි කර්මාන්ත හා
පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07
1995.06.13

සියලුම ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**තනතුරු හැරගිය නිලධරයකු හෝ කිසියම් විනය නියෝගයක් ලත් නිලධරයකු කරුණු ඉදිරිපත් කිරීම - ආයතන සංග්‍රහයට සංශෝධන**
**<u>II,V,XXVIII හා XLVIII වැනි පරිච්ඡේදය</u>**

ආයතන සංග්‍රහයේ පහත සඳහන් වගන්ති මෙහි දක්වා ඇති අයුරු සංශෝධනය කරනු ලැබේ.

(1) <u>V වැනි පරිච්ඡේදය - 7:4 වගන්තිය</u>

" 7:4 සැහෙන කාල සීමාවක් ඇතුලතදී, (සැහෙන කාල සීමාව යනු මාස තුනකි) ඔහු/ඇය සිය කැමැත්තෙන්ම තම නිදහසට කරුණු කියා සිටියහොත්, විනය රීතින්ට අනුකූලව, නිසි විනය බලධාරියා ඒ කරුණු සලකා බැලිය යුතුය. එසේ සලකා බැලීමෙන් පසු ඔහුට නැවත සේවයට පැමිණීමට අවසර දීම හෝ අවසර නොදීම හෝ එකී බලධාරියාට කළ හැකිය. (XLVIII වැනි පරිච්ඡේදය ද බලන්න)"

(2) <u>XXVIII වැනි පරිච්ඡේදය - 6:2:1 උප වගන්තිය</u>

" 6:2:1 මාස තුනකට වඩා ඉහත දුන් නියෝගයකට විරුද්ධව ඉදිරිපත් කල අභියාචනයක් අඩංගු වූ විට හා එම ප්‍රමාණය ගැන සැහෙන පැහැදිලි කිරීමක් එහි දක්වා නැති විට"

(3) <u>XLVIII වැනි පරිච්ඡේදය - 17:4 වගන්තිය</u>

"17:4 විනය බලධාරියා විසින් කරනු ලැබූ නියෝගයේ දින සිට මාස තුනක් ඇතුලත ලිඛිතව අභියාචනයක් ඉදිරිපත් කළ යුතුය."

**02.** තව ද, "පරිවාස කාලයේ පසුවන නිලධාරීන්ගේ පත්වීම් අවසන් කිරීම පිළිබඳ අභියාචනා ආයතන සංග්‍රහය සංශෝධනය කිරීම - II වන පරිච්ඡේදය" යනුවෙන් 1993.09.06 දිනැතිව නිකුත් කරන ලද අංක 20/93 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 වන වගන්තියේ අවසන සඳහන්

"(කරුණාකර ආයතන සංග්‍රහයේ <u>XXVIII</u> පරිච්ඡේදයේ 6:2 හා 6:2:1
උප වගන්ති ද බලන්න)"

යන්න, සංශෝධිත ඉහත 01 හි (2) වන උපවගන්තිය හා නොගැලපෙන බැවින්, එය මෙයින් අවලංගු කරමි.

**02.** මෙම චක්‍රලේඛය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකගත්වය ඇතිව නිකුත් කරනු ලැබේ.

අ.කලේ/(**ආර්.එස්.ජයරත්න**)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි කර්මාන්ත හා
පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය